# සංක්ෂිප්තය

අපට ජීවිය ලබා දුන් ලොවෙහි පවත්නා ඇරඹුම හෝ අවසානය මෙතෙකැයි නිශ්චය කළ නොහැකි යම් කිසිවක් ඇත්නම් ඒ අතර සාහිත්‍ය ද වේ. සාහිත්‍යමය රසයක් අත්විඳීමෙන් ආනන්දයෙන් ප්‍රඥාව කරා ගෙන යාමක් සිදු වනු ඇත. එකී සාහිත්‍ය රසය විඳීම හේතුවෙන් අප සිත් සතන් පුබුදු කරනු ලබයි. සාහිත්‍ය සෑම අවස්ථාවකදීම පිරි ඇත්තේය. සහිත බව සාහිත්‍ය යැයි ප්‍රකාශ කරන්නේ ද එනිසයි. මෙවන් වූ වටිනා සාහිත්‍යකට උරුමකම් කියන අප තුළින් වර්තමානයේ ගිලිහී යන්නේ ද සාහිත්‍ය රසවින්දනයයි. කෙසේ වුව ද පාසල් සිසුන්ට මව්බස සමඟින් සාහිත්‍ය ද ඉගෙන ගැනීමට නියමිතය. සිංහල භාෂාව හා සාහිත්‍ය අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටින සිසුන්ට නියමිත හර විෂයක් වේ. තෝරා ගත් පාසලේ අ.පො.ස. (සා.පෙළ) සිසුන් සිංහල සාහිත්‍ය ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමේ දී ගැටලුකාරී තත්වයන්ට මුහුණ දෙන බවත්, සිංහල භාෂාවට අවම ලකුණු ප්‍රමාණයක් බහුතරයක් සිසුන් ලබා ගන්නා බවත් ලේඛන පරික්ෂාවෙන් අනාවරණය විය. අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ විෂය ප්‍රතිඵල සංවර්ධනය විෂය භාර ගුරුවරයාට ඍජුවම බලපාන කරුණකි. එනිසා, වාර පරීක්ෂණවල ලකුණු 40 ට අඩු ලකුණු ලැබූ සිසුන් ප්‍රතිකාර්ය ඉගෙනුම් සඳහා යොමු කිරීම වර්තමානයේ සුලබව සිදු වන්නකි. එහෙත් බොහෝ විට සිදු වන ඒකාකාරී ප්‍රතිකාර්ය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද මඟින් වඩා ඵලදායි සාධනීය ඉලක්ක කරා ළඟා විය හැකි ද යන්න ගැටලුවකි. මෙවන් පසුබිමක් මත සිංහල සාහිත්‍ය ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමේ දී 11 ශ්‍රේණියේ සිසුන් මුහුණ දෙන ගැටලු අවම කිරීම පිළිබඳ කාර්ය මූලික පර්යේෂණයක් කිරීමට උත්සාහ ගැණුනි. අධ්‍යයනයට අදාළව සිදු කළ න්‍යායාත්මක සාහිත්‍ය විමර්ශනයේ දී භාෂාවේ මනෝවිද්‍යාත්මක පදනම යටතේ ජීන් පියාජේගේ බුද්ධි සංවර්ධන න්‍යාය හා විගොට්ස්කිගේ භාෂා සංවර්ධන න්‍යාය පිළිබඳ විමර්ශනයක යෙදුණි. පර්යේෂණයට අදාළ න්‍යායාත්මක පසුබිම විග්‍රහ කිරීමේ දී එම න්‍යායයන් පදනම් කර ගන්නා ලදී. අධ්‍යයනයට අදාළව සිදු කරන ලද ආනුභවික විමර්ශනය දී භාෂාව හා සාහිත්‍ය ඉගැන්වීමේ දී සිසුන් මුහුණ දෙන අධ්‍යාපනික ගැටලු, භාෂා හා සාක්ෂරතාව සම්බන්ධ ගැටලු, ඉගැන්වීම් ක්‍රම ශිෂ්‍ය සාධනයට බලපාන ආකාරය සහ එම ගැටලු විසඳීමට ගත් ක්‍රියාමාර්ගවල ස්වභාවය යන කරුණු දේශීය මෙන්ම විදේශීය පර්යේෂණ සාහිත්‍යයන් මඟින් විමර්ශනයට ලක් කෙරිණ. ඊට අමතරව වත්මන් පර්යේෂණ අධ්‍යයනය කාර්ය මූලික අධ්‍යයනයක් බැවින් විවිධ විෂයන් සම්බන්ධයෙන් සිදු කරන ලද කාර්ය මූලික පර්යේෂණ සාහිත්‍යයක් ද ඉදිරිපත් කෙරුණි. එම කාර්ය මූලික පර්යේෂණවල පර්යේෂණ ක්‍රමවේදය, පර්යේෂණ අනාවරණ, නිගමන හා යෝජනා අධ්‍යයනය කරන ලදී. පහත සඳහන් වන සුවිශේෂී අරමුණු 5 ඔස්සේ ක්‍රියාත්මක කරන ලද මෙම අධ්‍යයනයට ගුණාත්මක ප්‍රවේශය යටතේ කාර්ය මූලික පිරිසැලසුම යොදා ගැනිණ. සිංහල සාහිත්‍ය ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමේ දී ගැටලු ඇති 11 ශ්‍රේණියේ සිසුන් හඳුනා ගැනීම, එම සිසුන්ගේ ගැටලුවලට බලපාන හේතු හඳුනා ගැනීම, එම සිසුන් සඳහා ප්‍රතිකාර්ය වැඩසටහන් සංවර්ධනය කොට ක්‍රියාත්මක කිරීම, එම සිසුන්ගේ ගැටලු අවම කිරීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රතිකාර්ය වැඩසටහනෙහි සාර්ථක අසාර්ථක බව විමසා බැලීම, අනාගත පර්යේෂණ සඳහා

ඉඟි ඉදිරිපත් කිරීම එම අරමුණුය. ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල අධ්‍යාපන කලාපයේ , ගාල්ල අධ්‍යාපන කොට්ඨාසයේ තෝරා ගත් පාසලේ 11 වෙනි ශ්‍රේණියේ සිසුන් 10 දෙනෙකු කාර්ය මූලික පර්යේෂණ සහභාගිකයන් ලෙස තෝරා ගන්නා ලදි. සහභාගිකයන්ට අදාළව නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ලේඛනගත වාර්තා පරීක්ෂාව සහ සාධන පරීක්ෂණ මඟින් දත්ත රැස් කර ගත් අතර, රැස් කර ගත් දත්ත ප්‍රතිශත, සංඛ්‍යා එකතු කිරීමේ යන ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම ශිල්ප මඟින් මෙන්ම සාරාංශගත, විස්තරාත්මක, ව්‍යුහාත්මක සන්ධාර විශ්ලේෂණ යන ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම ශිල්ප මඟින් ද විශ්ලේෂණය කරන ලදි. දත්ත අර්ථකථනය අරමුණු මූලිකව සිදු කරනු ලැබීය. එහි දී 11 වෙනි ශ්‍රේණියේ සිසුන් සිංහල සාහිත්‍ය ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමේ දී මතක තබා ගැනීමේ ගැටලු, අවධානය රඳවා ගැනීමේ ගැටලු, භාෂාවේ අර්ථාවබෝධය පිළිබඳ ගැටලු, විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල බව පිළිබඳ ගැටලු, නිරන්තරයෙන් සතත්‍යාභ්‍යාසවල නොයේදීම පිළිබඳ ගැටලු, නිර්දිෂ්ට ග්‍රන්ථ කියවීම අවම වීම සම්බන්ධ ගැටලු යනාදියට මුහුණ දෙනු ලබන බව අනාවරණය විය. එමෙන්ම, .මෙම ගැටලු ඇති වීමට සාහිත්‍ය ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමට කැමැත්ත උනන්දුව අවම වීම, පාසල් පැමිණීම දුර්වල වීම, ඉගෙනීම සඳහා පවුලෙන් ලැබෙන පිටිවහල අවම වීම, පිළිතුරු ලිවීමට කරුණු නිර්මාණශීලීව, විචාරශීලීව පෙළ ගස්වා ගැනීමට අසීරු වීම, විෂය කරුණු මතක තබා ගැනීම අසීරු වීම, ඔවුන්ගේ සමාජ හා ආර්ථික පසුබිම සම්බන්ධ සාධක යනාදිය හේතු වශයෙන් අනාවරණය විය. එසේම, මෙම අධ්‍යයනයේ අනාවරණයන්ට අනුව මැදිහත්වීම සැලසුම් කර ක්‍රියාත්මක කෙරිණ. මැදිහත්වීම චක්‍ර 3ක් යටතේ මාස 3ක කාලයක ක්‍රියාත්මක විය. පළමු අපේක්ෂිත ඉලක්කය වූයේ සිංහල සාහිත්‍ය සංග්‍රහයේ නිර්දිෂ්ට පාඩම්වලට අදාළව කෙටි පිළිතුරු ලිවීමේ කුසලතාවය සංවර්ධනය කිරීමයි. එම ඉලක්කය සඳහා සති 4ක කාලයක් යොදා ගැනිණ. සතියකට පියවර 3ක් ඔස්සේ මැදිහත්වීමේ වැඩසටහන ක්‍රියාත්මක විය. දෙවන අපේක්ෂිත ඉලක්කය ලෙස සිංහල සාහිත්‍ය සංග්‍රහයේ නිර්දිෂ්ට පාඩම්වලට අදාළව අර්ථාවබෝධය පිළිබඳ සාධනය ඉහළ නැංවීම සඳහන් කළ හැකිය. සිංහල සාහිත්‍ය සංග්‍රහයේ නිර්දිෂ්ට පාඩම්වල විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල කුසලතා ඉහළ නැංවීම තෙවන අපේක්ෂිත ඉලක්කය විය. මෙම ඉලක්ක දෙක සඳහා ද සතියකට පියවර 3ක් ඔස්සේ සති 4 බැගින් කාලයක් මැදිහත්වීමේ වැඩසටහන ක්‍රියාත්මක විය. එමෙන්ම, වත්මන් අධ්‍යයනය තුළ මැදිහත්වීම ක්‍රියාත්මක කිරීමේ දී ලද අත්දැකීම් හා සිදු කරන ලද නිරීක්ෂණ තුළින් අනාගත පර්යේෂකයන් සඳහා ඉඟි ඉදිරිපත් කිරීම ද සිදු කරන ලදී.

## Abstract

Literature is among something which we can't decide what the beginning or the end of the world we live. It has been taken place by experiencing the appreciation of literature from delight to wisdom.When appreciating the literature,our minds are awaken. Literature has always been filled with something.That is why the literature is meant by the completeness.This appreciation of literature is becoming less and less today. However school children are to be learnt sinhala literature with their Sinhala languge as a subject. For the G. C. E (O/ L) students,the sinhala language and Literary Appreciation is a basket subject. Students in some schools are facing problems. When answering the Sinhala Literature paper. By examining some reports,it has been revealed that students have recorded less marks for the literature paper than the sinhala language paper.The result improvement of the G.C.E.(O/L) exam is directly applied to the subject in-charge teachers. It is a common practice to direct the students who scored lower than 40 for the remedial teaching. But it is questionable whether to achieve the expected targets with the monotonous remedial teaching learning methods used most of the time. There fore we have tried to do an action research on minimizing the problems faced by the Grade 11 students,when answering the questions in the sinhala literature paper. According to the study of theoretical literature investigation, it has been investigated under the psychological foundation of Jean Piage's intelligence development theory of Vegotskey. Analysing the theoretical background of this research, those theories are based on the above facts. In the systematic review of the study, the local as well as the foreign research literature investigated the educational problems faced by the students in the teaching the language and literature, the language and literacy issues, how the teaching methods affect the student performance and the nature of the measures taken to solve these problems. In addition, since the current research study is a preliminary study, a work - related research literature on different subjects was presented. The research methodology, research finding conclusions and proposals of those research were thoroughly studied. This study was carried out on the following five specific objectives : the functional layout under the qualitative approach.Identify the students' problems in answering the Sinhala Literature question paper in Grade 11, Identifying the reasons of such problems, Develop and implement remdial teaching programs for

these students. Examining the failure of the remedial programs implemented to minimize the problems of the the student, Presenting some clues for future researches. Accordingly, 10 students from selected school in the Galle Education Zone in Galle District were selected for the preliminary research participants. Data were collected through observation interviews, documented reports and performance tests, as well as qualitative data analysis techniques such as percentages, total collection of data as well as summative, descriptive and structural analysis. The interpretation of the data was done objectively. As a result, several difficulties faced by the students in Grade 11 were identified. Those are memorizing problems, problems of language interpretation analytically, critically and logically. Lack of frequent exercise and lack of critical reading. Also, the lack of willingness to answer the literary question paper, the lack of school attendance, the lack of family support, the difficulty of writing and critically engaging, difficulty to remember subject material, and difficulties related to their social and economic background etc. were largely disclosed. At the same time, the intervention was designed and implemented according to the findings of this study. The intervention took place in three circles for a three month of time.The first expected target was to improne the skill of writing short answers for the prescribed Sinhala Literary text.To achieve that a for weeks time was taken. The intervention programme was conducted as three steps for a week. The second expected target was to improve the contextual knowiedge on the prescribed Sinhala literary text.The third expected target was to improve the analytical,critical and prescribed Sinhala literary text.To achieve thosetwo targets again a four weeks period with three steps in each week was given to the both expected targets. In the present study, the experience of implementing the intervention and the observations, finally which can launch researches for future researches has been done.